**මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**පුරප්පාඩු**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

1) අවශ්‍ය සුදුසුකම් : 1. අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී

   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

   සහ

   2. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් 3ක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

   3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

   (අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්
   හා

   (ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

2) වෙනත් සුදුසුකම් (අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

   (ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

   (ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

3) **වැටුප් ක්‍රමය : 49,475- 17x540 – 58,655 (මාසික) U-MN-1 (III)
   කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව අදාල උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ.

4) බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත පරීක්ෂණය (ලකුණු 75%) හා සම්මුඛ පරීක්ෂණය (ලකුණු 25%) මගින්

   - සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
   - බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
   - පරිගණක සාක්ෂරතාවය

**02.** <u>වැඩ සහයක (III ශ්‍රේණිය)</u>

| | | | |
|---|---|---|---|
| 1) | සුදුසුකම් | : | අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 6 ක් සමත් වී තිබිය යුතුය. |
| 2) | වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| 3) | වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| 4) | **වැටුප් ක්‍රමය | : | UPL1 (III) රු. 42,775 -16x450 -49,975 (මාසික) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 (i) අනුව අදාල උපදෙස් අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| 5) | බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින් |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් හා සහතික කරන ලද සහතිකවල පිටපත් ද සහිතව 2025.05.09 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් මොරටුව විශ්වවිද්‍යාලයේ https://uom.lk/vacancies.වෙබ් අඩවිය මඟින් බා ගත කල හැක.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාතර්මේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාතර්මේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි අදාල දෙපාතර්මේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරි,<br>
මොරටුව විශ්වවිද්‍යාලය,<br>
මොරටුව.<br>
2025.04.20